# වික්ටෝරියා

# සිහින සැබෑවන විට...

ජේ. ආර්. ජයවර්ධන

| | |
|---|---|
| පරි. [illegible] | 6567 |
| [illegible] | 808.51 |
| දිනය | |

# සිහින සැබෑවන විට...

## ගරුතර ජනාධිපති, ජේ. ආර්. ජයවර්ධන උතුමාණන් විසිනි

අප රටේ ආරම්භ කරන ලද විශාල ම සංවර්ධන යෝජනා ක්‍රමය නම් මහවැලි ගංගා කඩිනම් යෝජනා ක්‍රමය යි. අපේ ඉතිහාසය දෙස බලන විට මහා වාරිමාර්ගවලින් සමන්විත වූ ජලාශ, ජල මාර්ග හා ඉඩම් සංස්ථාපනය පිළිබඳ විශිෂ්ඨතම වාර්තාවක් දකින්නට ලැබෙන නමුදු වසර දෙදහස් ගණනකට පෙර එම මහා වාරිමාර්ග හා වැව් කර්මාන්ත ඉදි කරන ලද්දේ එක එල්ලේ ම නොව ශත වර්ෂ ගණනාවක් අතරතුර බව අපට පෙනී යයි. එහෙත් අද දින මේ නවීන යාන්ත්‍රික යුගයේ මිනිසා විසින් නිර්මාණය කර ඇති ගල්වෙඩි, යන්ත්‍ර සූත්‍ර හා බල ශක්ති ක්‍රම හේතුකොටගෙන ඒ කාලයේ ශතවර්ෂ ගණන් ගත වූ මහා කර්මාන්ත ඉතා කඩිනමින් සපුරා ලන්නට අපට පුළුවන්කම ලැබී තිබේ. මහවැලි ගංගා සංවර්ධන ව්‍යාපාරය කඩිනම් ලෙස ක්‍රියාත්මක කර එක වරම සම්පූර්ණ කරන්නට අපට හැකියාව ලැබී තිබෙන්නේ එහෙයිනි.

වත්මන් රජය වැඩ භාරගන්නා විට මහවැලි ගංගා සංවර්ධන යෝජනා ක්‍රමය ගොළුබෙලි ගමනින් වැඩ කටයුතුවල යෙදී තිබෙනු දක්නා ලදී. මහවැලි යෝජනා ක්‍රමයේ ආරම්භය දිවංගත අගමැති ඩඩ්ලි සේනානායක මහතා විසින් ක්‍රියාත්මක කරන්නට පටන් ගන්නා ලද්දේ වර්ෂ 1970 පෙබරවාරි මාසයේ දී ය. මෙය වූ කලී වර්ෂ එක්දහස් නවසිය තිස් ගණන් වල දී ඩොනොමෝර් ආණ්ඩු ක්‍රමය යටතේ මෙරටේ කෘෂි කර්මාන්තය හා වාරි කර්මාන්තය පිළිබඳ නව දියුණුවක්, නව ජීවනයක් ඇති කරන්නට පෙරුම්පුරා සිටි මහාමාන්‍ය ඩී. එස්. සේනානායක මහතාණන් ගේ සිහින යක් සැබෑ වීමකි.

එසමයේ ඉතා කෘතහස්ත ඉංජිනේරු විද්‍යාඥයෙකු ව සිටි ආර්. බ්‍රෝහියර් මහතා හා සමග ඩී. එස්. සේනානායක මහතා රජරට වල්බිහි වී තිබුණු ඉඩම් සහ ජරාවාස වී තිබුණු වාරිමාර්ග ද කැඩී බිඳී තිබුණු මහා වැව් ද එකින් එක සමීක්ෂණය කොට ඒ හැම කර්මාන්තයක් ම ප්‍රතිසංස්කරණය කරන්නට අධිෂ්ඨානය කරගත් බව අපි දනිමු. වල් බිහිවී තිබුණු රජරට පුරා විසිරී ගිය කැලෑවල් කොටා මැලේරියා උණය සමූලෝත්පාටනය කොට, ක්‍රිස්තු පූර්ව හය වැනි සියවසේ දී අතිමාත්‍ර දියුණුවට පත් වී කාලයාගේ ඇවෑමෙන් ජරාවාස වී, වල්බිහි වී නටබුන් වී තිබුණු රජරට යළිත් ජනස්ථාපනය කිරීමේ මහා ව්‍යාපාරයට මුලපිරූ බවත්, අපි දනිමු.

**එක්දහස් නවසිය තිස් ගණන්වල දී එක් දවසක් ඩී. එස්. සේනානායක මහතා මාත් කැටුව පරාක්‍රම සමුද්‍ර තානායමේ දී මෙබඳු කතාවක් කළා මට මතකයි. අපේ කට්ටියේ ඩඩ්ලි සේනානායක මහතාත් එවකට පොලොන්නරුවේ උප දිසාපති පදවිය දැරූ සී. පී. ද සිල්වා මහතාත් වූහ. පරාක්‍රම**

සමුද්‍රයේ පුරාණ වැ කණ්ඩිය ප්‍රතිසංස්කරණය කිරීමේ වැදගත්කම විදහා දක්වමින් එදා ඩී. එස්. සේනානායක මහතා මෙසේ කීවා මට මතක ය:

"අද පොලොන්නරුව අවට තිබෙන කුඹුරු පමණක් නොව රජ රටේ විහිදී ඇති බොහෝ ගොඩ මඩ ඉඩම් මුඩු වී තිබෙන්නේ එම ඉඩම් ගොවිතැන් කිරීම සඳහා ජලය නැතිවීම නිස යි. මේ ළඟින් මේ අවටින් මහවැලි ගංගාව ගලාගෙන යතත් අපට මේ ප්‍රදේශයේ ගොවිතැන් සඳහා වතුර ලබා ගැනීමේ ස්ථාවර ක්‍රමයක් නැත. නිරිතදිග මෝසමෙන් ලැබෙන වර්ෂා ජලය නිසි පරිදි පරිහරණය කර ගොවිතැන් සශ්‍රීක කර ගන්නට අපට ඉඩක් නැත. මේ ප්‍රදේශයෙන් මහවැලි ගංගාව ගලා යන්නේ ඉතා පහළ මට්ටමකින් නිසා ඒ ගංගා ජලයෙනුත් ප්‍රයෝජනයක් ගන්නට රජරට වැසියන්ට පුළුවන් කමක් නැත. පුරාණ කාලයේ සිංහලයින් මහවැලි ගංගාවේ ජලය සැතපුම් 75 ක් පමණ දිගින් දිගට ජල මාර්ගයක් ඔස්සේ ගමන් කරවා වී ගොවිතැන් කරන්නට සෑහෙන පමණ ජලය ලබාගත් නමුත් මිණිපේ සිට මින්නේරිය වැව දක්වා වැටුණු ඒ පුරාතන වාරිමාර්ගවල සලකුණක්, සේයාවක්වත් අද දකින්නට නැත. මේ අතර මිණිපේ අමුණ ප්‍රතිසංස්කරණය කරන්නට මුල පුරන්නේ මින්නේරිය දක්වා ජලය ලබා ගැනීමේ අරමුණ ඇතිව යි. ඒ පුරාතන වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කිරීම අතිශයින් ම අවශ්‍ය වන්නේ අපේ වී ගොවිතැනට එය නැතිව ම බැරි නිසා ය. රජ රටේ වැසි නැති වූ නියං කාලයේ දී වුවත් වී ගොවිතැන සශ්‍රීක ලෙස කරන්නට පුළුවන් වන පරිදි කවදා හෝ අප මේ මහවැලි ගංගාවේ ජලය ප්‍රයෝජනයට ගත යුතු ය."

එසේ වුවත් ඩී. එස්. සේනානායක මහතා දුටු මේ සිහිනය සත්‍යාර්ථයෙන්ම සැබෑවක් කර ගන්නට නොහැකි වූයේ, එසමයේ. විසිපස් අවුරුද්දක් පමණ වූ කාලයක් ම රජ රටේ මින්නේරිය, පරාක්‍රම සමුද්‍රය, නාච්චදූව, කලා වැව, තිසා වැව, පදවිය හා යෝද ඇළ ආදී මහා වාපින් හා මහා වාරි කර්මාන්ත ප්‍රතිසංස්කරණය කරන්නට කාලය යොදවන්නට සිදුවූ බැවිනි.

වර්ෂ 1956 සී. පී. ද සිල්වා මහතා කෘෂිකර්ම ඇමති ධූරයට පත් වූ කාලයේ කලින් ඩී. එස්. සේනානායක මහතාණන්ගේ ආභාෂය ලැබූ පරිද්දෙන්ම මහවැලි යෝජනා ක්‍රමය ආරම්භ කිරීම සඳහා ලෝක බැංකුවේ ද ආධාර ලබාගෙන විශේෂඥයින්ගේ උපදේශයත් ලබාගෙන මහවැලි ගංගා සංවර්ධන ව්‍යාපාරය ආරම්භ කළේ ය. මෙය අවුරුදු 30 කට සීමා වූ යෝජනා ක්‍රමයක් විය. එහි පළමුවෙනි පියවර වූයේ. මහනුවරට උතුරින් මහවැලි ගංගාවේ ජලය උමගක මාර්ගයෙන් උතුරට හරවා මාතලේ කඳුකරය දක්වා ගෙන ගොස් දඹුල්ල, අනුරාධපුර ආදී ප්‍රදේශවල ජලාශ පළමුවත්,

පොළොන්නරුව ප්‍රදේශයේ ජලාශ දෙවනුවත් සම්පූර්ණ කර වියලි කලාප යට ජල සම්පාදනය කිරීමයි. වර්ෂ 1970 දී ඩඩ්ලි සේනානායක මහතා විසින් සමාරම්භ කරන ලද්දේ මෙම යෝජනා ක්‍රමය යි.

වත්මන් රජය බලයට පත් වූ අවස්ථාවේදී මෙම යෝජනා ක්‍රමය තව දුරටත් ගෙන යන්නේ කෙසේ දැයි පිළිබඳව කිසිදු යෝජනාදියක් නොවී ය. වර්ෂ 1977නේ ඔක්තෝබර් මාසයේ දී මම මුළු අමාත්‍ය මණ්ඩලය ම මහ වැලි සංවර්ධන අධිකාරියේ රැස්වීම් ශාලාවට කැඳවා මෙම මහවැලි යෝජනා ක්‍රමය කඩිනම් කිරීමේ පියවරක් ගැනීමට එම ඇමතිවරුන් හා නිලධාරීන් සමග සාකච්ඡාවක් පැවැත්වූයෙමි. මේ කඩිනම් කිරීමෙන් අදහස් කළේ මුලින් යෝජනාකර තිබුණු පරිදි දඹුල්ල, අනුරාධපුර ප්‍රදේශයේ වාරි කර්මාන්ත පමණක් නොව මහියංගනය, පොළොන්නරුව හා ත්‍රිකුණාමල ප්‍රදේශවලටත් මහවැලි ගංගාවේ ජලය ප්‍රමාණවත් පරිදි ලබාගැනීමේ සර්ව සම්පූර්ණ යෝජනා මාලාවකි. මෙහි සඳහන් කළ දෙවැනි පියවරට කොත්මලේ බහුකාර්ය ජලාශයක් ඉදිකිරීමත් පොල්ගොල්ල හා මහියංගනය අතර මැද වික්ටෝරියා (තෙල්දෙණිය) කඳුකරයේ ජලාශය ඉදිකිරීමත් වික්ටෝරියා ජලාශය හා දැනට තිබෙන මිණිපේ වැව අතරමැද ප්‍රදේශයේ රන්දෙණිගල ජලාශය ඉදිකිරීමත් ඇළහැර ජලමාර්ගය හා බෝවතැන්න ජලාශය අතරමැද මොරගහකන්ද ජලාශයත් අපේ ගංගා ජලාශ්‍රයෙන් බෝවතැන්න ජලාශයත් ඉදි කිරීමයි. තවත් ප්‍රධානතම ජලාශයක් නම් පොළොන්නරුව නැගෙනහිර දිගින් වූ මාදුරු ඔය ජලාශය යි. තවද, මේ ක්‍රමයට අදාල වූ වෙනත් සුළු ජලාශ ද ගණනාවක් විය.

මවිසින් පවත්වන ලද මෙම සාකච්ඡාවේදී මහවැලි සංවර්ධන අධිකාරියේ නිලධාරීන් මට කියා සිටියේ, මෙහි දැක්වූ විවිධ කර්මාන්ත හා යෝජනා ක්‍රම වෙන් වෙන් වශයෙන් නොව එකවිටම පටන් ගෙන ඒවා සර්ව සාර්ථක කර ගැනීම සඳහා දැනට කාර්යාලවල වැඩක් නැතිව සිටින ඉංජිනේරුවරුන්ගේ හා මිණුම්කරුවන්ගේ හා වෙනත් සුදුසුකම් ලත් කාර්මික නිලධාරීන්ගේ සේවය ලබාගත හැකි බව යි. මේ මහා කර්මාන්ත සියල්ලම එක විට ආරම්භ කොට එක විට සපුරා ගත හැක්කේ කෙසේ දැයි විස්තර වාර්තාවක් සපයන ලෙස මම එම අධිකාරියෙන් ඉල්ලා සිටියෙමි. එසේම ඒ සඳහා වැය වන මුදල්, කාර්මික ශක්තිය හා යන්ත්‍ර සූත්‍ර ආදිය කොපමණ වේද යනුත් මට වාර්තා කරන ලෙස මම දැන්වීමි. මෙකී වාර්තාව මාස කිපයක් අතරතුර දී රජයට ලැබුණු අතර, ඒ අනුව මහවැලි සංවර්ධන කඩිනම් ව්‍යාපාරය ආරම්භ කරන්නට රජය තීරණය කළා ය. එසමයේ ඒ සඳහා වැය වෙතැයි ගණන් බලන ලද වියදම මෙසේ ය:--

| | | | | |
|---|---|---|---|---|
| | | මුළු මුදල රුපියල් ලක්ෂවලින් | | එයම විදේශ විනුමෙන් |
| (1) වික්ටෝරියා ජලාශ යෝජනා ක්‍රමය | ... | 34,80 | ... | 22,50 |
| (2) මදුරුඔය යෝජනා ක්‍රමය | ... | 12,00 | ... | 7,50 |
| (3) කොත්මලේ යෝජනා ක්‍රමය | ... | 25,00 | ... | 18,00 |
| (4) රන්දෙනිගල යෝජනා ක්‍රමය | ... | 25,00 | ... | 16,00 |
| (5) මොරගහකන්ද යෝජනා ක්‍රමය | ... | 25,00 | ... | 16,00 |
| (6) අක්කර 30,00,000ක් සංවර්ධන කිරිම | ... | 70,00,00 | ... | 15,00 |

මෙහි දක්වූ මුල් යෝජනා ක්‍රම පිළිබඳ වියදම දැනට රුපියල් ලක්ෂ 40,000 කින් වැඩි වී තිබේ.

මෙහි සදහන් කළේ අවශ්‍ය විය හැකිව තිබුණු මුදල් සම්භාරයෙන් කොටසක් පමණකි. වාරිමාර්ග සංවර්ධන ප්‍රදේශය අක්කර 3,20,000 කි; මේ අනුව 3,50,000 දෙනෙකුට රැකියා ලැබීමෙන් නව සභ්‍යත්වයක් සමාරම්භ වෙයි. මෙම මහා යෝජනා ක්‍රමය ආරම්භ කරන්නට තිරණය කළ අවස්ථාවේදී ඒ සඳහා මුදල් හා ද්‍රව්‍ය හ මිනිස් ශ්‍රමය ලබාගත හැක්කේ කෙසේ දැයි රජය නියැකවම දැන නොසිටියා ය. ඒ වර්ෂ 1978 දී ය. අමුණු ගොඩනැංවීම (එක් අමුණක් අඩි 400 කට වඩා උස් විය.) සඳහා සැළසුම් පත් පිළියෙල කිරිම ආදී කටයුතුවලට අවුරුදු දෙකට වැඩි කාලයක් ගත විය. මේ යෝජනා ක්‍රමය පිළිබඳ වැඩදායක අධ්‍යයන සලකා බැලීමටත් ආධාර අනුග්‍රහ කරන්නට සෙසු රටවල් පෙළඹවීමටත් ඒ හා සමාන කාලයක් ගත විය.

මෙම කර්මාන්ත අතුරින් ප්‍රධාන ජල කර්මාන්ත යෝජනා ක්‍රම වෙනුවෙන් මුදලින් ආධාර සපයන්නට ප්‍රතිඥා දී සිටින ස්වීඩනය, එක්සත් රාජධානිය, කැනඩාව, බටහිර ජර්මනිය හා ජපානය යන රටවලට අපි ස්තුති වන්ත වෙමු. එසේම ජල කර්මාන්ත සම්පාදනය සඳහා ආධාර ප්‍රතිඥා දී ඇති ලෝක බැංකුව, යුරෝපීය ආර්ථික කලාපීය රටවල්, අමෙරිකා එක්සත් ජනපදය හා වෙනත් රටවල් වලටද ස්තුතිවන්ත වෙමු. මෙකී භාරදූර කාර්යයන්හි කාර්යාල ඇතුළතදී මෙන් ම ක්ෂේත්‍රවලදීත් ස්වකිය කාලය හා ශක්තිය යොදවා ක්‍රියා කරන සියළුම නිළධාරින්ටත් ස්තුතිවන්ත වෙමු. මෙම කර්මාන්තයේ මූලික කටයුතු සර්ව සාර්ථක කර ගන්නට සහයෝගය දුන් මැති ඇමති වරුන්ටත් වියලි කලාපයේ සෑම අවිවේ ශ්‍රමදාන වැඩ කළ හැම දෙනාටත් ස්තුතිවන්ත වෙමු.

මෙම කාර්යය ආරම්භ කිරීම විහිළුවට ලක් කරමින් ප්‍රසිද්ධ සභාවලදීත්, ඇතැම් විට පාර්ලිමේන්තුවේදීත් කථා කළ බොහෝ දෙනෙක් මේ රටේ සිටිති. අප මුලින් සිතා සිටි ආකාරයෙන් එසේ සිතා සිටි කාල සීමාව ඇතුළතදී අපේ යෝජනා ක්‍රමය සර්ව ප්‍රකාරයෙන් ම සම්පූර්ණ කරන්නට

ඉඩක් නොලැබිය හැකිය. එසේ වුවත් අපේ අධිෂ්ඨානය එය හැකි තරම් කඩිනම් ලෙස සාර්ථක කර ලීමයි. අපට ආධාර දෙන්නට ප්‍රතිඥා දී තිබුණු ධානපති රටවල් අපේ සංවර්ධන යෝජනා ක්‍රම පිළිබඳ සුපරීක්ෂාකාරී අධ්‍යයනයක් කිරීමට සෑහෙන කාලයක් ගෙන තිබීම මෙහි එක් හේතුවකි. අපේ යෝජනා ක්‍රමයේ ස්වභාවය ගැන සලකා බලන විට ඒවා ඉදිකිරීමේ කටයුතු පිළිබඳ සැලසුම් පත් අප නමුවේ වත් නොතිබුණු බව සලකන විට මෙකී රටවල් මෙම යෝජනා ක්‍රමය ගැන සලකා බලන්නට මෙතෙක් කාලයක් ගැනීම කිසිම ලෙසකින් පුදුමයට හේතු නොවේ. ආධාර දීමට ප්‍රතිඥා දීමෙන් පසුව එසේ ප්‍රතිඥා දී තිබුණු රටවල් වල ආණ්ඩු වෙනස්වීම නිසාත්, ආධාර දීමේකටයුතු තීරණය කිරීම පිළිබඳ දුෂ්කරතා ඇති තිබේ. එහෙත් ඒ දුෂ්කර අදියර දැන් අවසන් වී ඇත. මහා ජලාශ පමණක් නොව මහා වාරි කර්මාන්තත් ඉදි කිරීමේ අදියරට අපි දැන් පැමිණ සිටිමු. කැලෑ කොටා ඉඩම් නිරවුල් කොට ජනස්ථාපනය කිරීමේ අදියරටත් අපි අනුක්‍රමයෙන් පැමිණ සිටිමු.

**මහවැලිගංගා සංවර්ධන යෝජනා ක්‍රමය වනාහි සත්‍යාර්ථයෙන් ම ඉමු වන ජාතික මෙහෙවරකි. මෙහි සමාප්තිය, මෙහි සාර්ථකත්වය රැඳී ඇත්තේ අප රටවාසී ඔබ හැමදෙනා අනය. මෙහි පල ප්‍රයෝජනත් ඔබ හැම සතුවන බව අමුතුවෙන් කිව යුතු නොවේ.**

(මේ වනාහි ගරුතර ජනාධිපති උතුමාණන් විසින් මාර්තු 23 වැනි ඉරු දින පුවත් පත් හි සිංහල, දෙමළ, ඉංග්‍රිසි යන භාෂා වලින් පල කරවන ලද විශේෂ ලිපියකි.)

**ගරුතර ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන උතුමාණන් තෙල්දෙණිය වික්ටෝරියා ජලාශයේ වැඩ කටයුතු ආරම්භ කරමින් පැවැත් වූ දේශනය යි.**

(වර්ෂ 1980 මාර්තු මස 23 වැනි දින)

ගරුතර මහා සංඝයා වහන්සේලාගෙන් අවසරයි; ගරු අගමැතිතුමා ගෙන් සහ මැතිණියගෙන් අවසරයි; මහා බ්‍රිතාන්‍යයේ ගරු ඇමතිතුමා ගෙන් සහ හිටපු ගරු ඇමැතිණියගෙන් අවසරයි; ඇමතිවරුනි, උප ඇමතිවරුනි, මන්ත්‍රීවරුනි, මිත්‍රවරුනි,

අද ඉතාමත් ම ඓතිහාසික දිනයක්. ඊ. එල්. සේනානායක මහත්මයා දුන් කළ කථාවෙන් මහවැලි ගංගා කඩිනම් සංවර්ධන ව්‍යාපාරය ගැන විස්තර අපට කියලා දුන්නා. අද අපි වික්ටෝරියා ජලාශයේ බැම්මේ අත්තිවාරම් කපන්නේ මහා බ්‍රිතාන්‍යයේ රාජ්‍යයේ ආධාර ලැබුන නිසයි. මහා බ්‍රිතාන්‍යයත් ලංකාවත් අතර දීර්ඝ සම්බන්ධකමක් තිබුණු බව අපි කවුරුත් දන්නවා. මහා බ්‍රිතාන්‍යයේ වික්ටෝරියා රාජිණිය සිහිවීමට සි වික්ටෝරියා දිය ඇල්ලට ඒ නම භාවිතා කළේ. ඒ නිසා මේ ජලාශය අපට නිතර ම මතක් වෙනවා. අපි නිතර නිතර ම කියනවා වික්ටෝරියා ජලාශය කියලා. වික්ටෝරියා මහා රැජිණිය කවුරුත් දන්නවා— ගුණසම්පන්න රැජිණියක් බව. මේ ලංකාවේ කළුතර ප්‍රදේශයේ තිබුණු ඓතිහාසික බෝධිය ලංකාවේ හිටපු යටත් විජිත ආණ්ඩුකාරතුමා සහ නිලධාරීන් කපන්නට සූදානම් වන විට, අප රට බෞද්ධයෝ පෙත්සමක් යැව්වා ආණ්ඩුකාර තුමාට ඒ බෝධිය කපන්න එපා කියලා. එහෙත්, ආණ්ඩුකාරයා ඒ පෙත්සම පිළිගත්තේ නැහැ. එවිට ඒ බව වික්ටෝරියා රැජිණියට පෙත්සම් මාර්ගයෙන් කියා යැව්වහම වික්ටෝරියා රැජිණ නියම කෙරුවා, රේල්පාර වෙන තැනකින් හදනවා මිසක් බෝධිය කපන්න එපා කියලා. මෙයින් පෙනෙනවා වික්ටෝරියා රැජිණ මහජන මතයට කොයිතරම් ඕනෑකමින් ඇහුම්කන් දුන්නාද යන වග.

ඊයේ පෙරේදා අගමැතිතුමයි, මමයි විවෘත කෙරුවා, ඒ බෝධිය ළඟ විශාල දාගැබක්. ඔය වැනි අන්දමට වික්ටෝරියා මහ රැජිණ ලංකාවට පමණක් නොවෙයි, මහා බ්‍රිතාන්‍යයේ අධිරාජ්‍යයට යටත්ව විශේෂයෙන් ම වහල් භාවයෙන් හිටපු යටත් විජිත වැසියන්ට උදව් කෙරුවා. මේ ලංකාව අවුරුදු දෙදහස් හාරසියයක් නිදහස් සුව විඳිමින් සිටලා 1815 දී බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට යටත් වුනා. උඩරට නායකවරු උඩරට ගිවිසුමේ මාර්ගයෙන් ලංකාව බ්‍රිතාන්‍ය රජයට පාවා දුන් බව කියනවා. අන්තිම සිංහල රජ්ජුරුවෝ බ්‍රිතාන්‍ය රාජ්‍යයට යටත් වී රජ පරම්පරාවෙන් අස් වුනා. මේ ළඟ තිබෙන මැද මහනුවර කියන ගමේ තමයි ඒ අන්තිම

අවාසනාවන්ත ඓතිහාසික සිද්ධිය වුනේ. ඊට පස්සේ තුන්වන ජෝර්ජ් රජ්ජුරුවන්ට සිංහල රාජධානිය අයිතිවෙලා, දෙවැනි එළිසබෙත් රැජිණියගේ කාලය වන තුරු අප රජ පරම්පරාවක් යටතේ පාලනය කරනු ලැබුවා. අවුරුදු 2,500ක කාලයක සිට විජය රජ්ජුරුවන්ගේ පටන් දෙවැනි එළිසබෙත් රැජිනගේ කාලය දක්වා (ජපන් අධිරාජ්‍යයත්, ඉරාන් අධිරාජ්‍යයත් ඇර) ලංකාවේ පමණයි එච්චර දීර්ඝ කාලයක් රජ පරම්පරාවක් අඛණ්ඩව රටක් පාලනය කෙරුවේ.

1972 දී ශ්‍රී ලංකාව ජනරජයක් උනාම ඒ රජ පරම්පරා යුගය අවසන් වුනා. අද අපි ජනරජයක් වෙලා තියෙනවා. මහවැලි ගඟ කඩිනම් ව්‍යාපාරය පටන් ගන්න උවමනාය කියලා මේ ජනරජය කල්පනා කෙරුවගම අපි ඒ වෙලාවේ හිතුවෙ නැහැ කොහොමද සල්ලි හොයා ගන්නේ? ඕන කරන අනික් කටයුතු කොහොමද ලබා ගන්නෙ? ආදී විස්තර ගැන. එංගලන්තයෙන් ඒ කාලයේ කම්කරු ආණ්ඩුවෙ ජූඩිත් හාට් මැතිණිය විදේශ සංවර්ධන ඇමතිණිය හැටියට ගිහියා. ගාමිණී දිසානායක ඇමතිතුමා එතුමිය මුණගැහිලා කථාබස් කළ වෙලාවේ එම මැතිනිය ඒ රාජ්‍යය වෙනුවෙන් පොරොන්දු වුනා වික්ටෝරියා ජලාශය හැදීමට අවශ්‍ය ඔක්කෝම මුදල් රුපියල් ලක්ෂ තිස්දාහක් විතර තෑග්ගක් වශයෙන්, කිසිම පොලියක් නැතිව, ණය මුදලක් නොවෙයි, තෑග්ගක් හැටියට දෙනවා කියලා. මේ වැඩ කටයුතු පටන් ගත් මේ මංගල අවස්ථාවෙ මම බොහොම සන්තෝසයෙන් ජූඩිත් හාට් මැතිණිය මේ වේදිකාවේදී පිළිගන්නවා. මම ලංකාව වෙනුවෙන්, ආණ්ඩුව වෙනුවෙන් මහජනයා වෙනුවෙන් ඒ මැතිණියව බොහෝ සතුටින් පිළි ගන්නවා. එංගලන්තයේ ආණ්ඩු මාරු වුනා—මහ මන්ත්‍රී තරඟයේ දී. ටික කාලයක්, අර කලින් දුන්න පොරොන්දු ඉෂ්ඨ කිරීමට අමාරු වුනා. ඉංග්‍රිසි ආණ්ඩුව කල්පනා කෙරුවා එහෙම විශාල පරිත්‍යාගයක් ඉෂ්ඨ කරන්න මුදල් තියෙනවාද? නැද්ද? යන කාරණය ගැන. එසේ කල්පනා කරලා මහා බ්‍රිතාන්‍ය ආණ්ඩුවෙන් අපට දුන්නා විශාල ම පරිත්‍යාග මුදල—කලින් ලංකාවට දෙන්න පොරොන්දු වී තිබුණු විශාල ධන පරිත්‍යාගය.

ගිය අවුරුද්දේ සැම්බියා රටේ ලුසාකා සම්මේලනයේ දී අපේ අගමැතිතුමාට හම්බ වුනා මාග්‍රට් තැචර් අගමැතිණිය—මහා බ්‍රිතාන්‍යයේ අගමැතිණිය. ඒ දෙන්නා සාකච්ඡා කරලා මාග්‍රට් තැචර් අගමැතිණිය මෙන්න මේ ප්‍රතිඥාව ලියලා දුන්නා කරදාසියක. වික්ටෝරියා ජලාශය හැදීමට, පොරොන්දු වුන මුදල සම්පූර්ණයෙන්ම දෙනවා—ඒ පොරොන්දුව ඉෂ්ඨ කරනවා කියලා.

ඒ පොරොන්දුව ඉෂ්ඨ කරමින් අපේ වැඩ පටන් ගැනීමට එංගලන්තයේ මාග්‍රට් තැචර් අගමැතිණියගේ ආණ්ඩුවේ විදේශ සංවර්ධන වැඩ භාර ඇමති ගරු නීල් මාටින් තුමා මේ වේදිකාවේ ඉන්නවා. එතුමාත් මම මේ වෙලාවේ බොහොම ආදරයෙන් පිළිගන්නවා. බ්‍රිතාන්‍ය ආණ්ඩුව

අපට දෙන උපකාර ගැන මේ වෙලාවේ මම වඩා කථා කරන්ට බලාපොරොත්තු වෙන්නේ නැහැ. **එහෙත්, මම කියන්න සතුටුයි අද මගේ හීනයක් සත්‍යයට පත් වෙන බව. ඒ බව මට නිසැකයෙන්ම පෙනෙනවා.**

අපි 1978 දී හීනයක් දැක්කා. පොත්පත්වල ඒ හීන විස්තර හා පලාපල ලියල තිබුනා. මහවැලි ගංගා සංවර්ධන ව්‍යාපාරය, කොත්මලේ වැව, වික්ටෝරියා වැව, මාදුරුඔය වැව, උල්හිටියා වැව, ගෝතවන වැව, රන්දෙණිගල වැව, මාදුරුගොඩ වැව ආදී යෝධ වැඩ අවුරුදු 30 කින් හදන්ට පුළුවන් කියලා. කොහොමද ඒවා හදන්නේ? කොහේද ඒවා හදන්නේ? කවුද ඒවා හදන්නේ? කවුද ඒවාට මුදල් දෙන්නේ? ආදී විස්තර අර හීන පලාපල විස්තරේ සටහන් වෙලා තිබුණේ නැහැ. ගරු ඩී. එස්. සේනානායක මහතා මුලින් ම—ඊට පස්සේ ඩඩ්ලි සේනානායක මැතිතුමා, ඊටත් පස්සේ සී. පී. ද සිල්වා ඇමතිතුමා, කල්පනා කරමින්—දිගින් දිගටම කල්පනා කරමින්—කටුගස්තොට පොල්ගොල්ල හරහා බැම්මක් හදලා, මහවැලි ගඟේ වතුර, රජරටට කලා වැව ප්‍රදේශයට—අනුරාධපුර ප්‍රදේශයට—ගෙන යන්න ක්‍රම යෙදුවා පමණයි. ඊට පස්සෙ මහවැලි ගංගා ව්‍යාපාරය කෙසේද පටන් ගන්නේ, කියලා කිසි කෙනෙක් කල්පනා කරලා තිබුණේ නැහැ. පොත් පත්වල තිබුණේ අවුරුදු 30කින් කරන්නට පුළුවන් කියලා පමණයි. අපේ ආණ්ඩුව මේ ගැන කල්පනා කරලා කළා. දිවා රෑ කල්පනා කළා. අන්තිමට එළිවෙන යාමේ අපි හීනයක් දැක්කා, මෙය කරන්න ඕන, අවුරුදු 30 ක් බලා ඉන්න බැහැ—අවුරුදු 10 ක් බලා ඉන්න බැහැ. වහ වහාම පටන් ගන්න ඕන! අවුරුදු 6 කින් (හයකින්) ඉවර කරන්න ඕන. කොහේද පටන් ගන්නේ, කවුද පටන් ගන්නේ? කවුද මුදල් දෙන්නේ? කොහොමද මේ බැමි හදන්නේ? යන කරුණු ඒ වෙලාවේ කල්පනා උනේ නැතත්, පෙර පිනකට වාගෙ, දෙන දෙයියෝ ගෙදරට ගෙනත් දුන්නා. **ඔව්! අපට මුදල් ලැබිලා තියෙනවා ඒ ඔක්කෝම වැව් හදන්න. හදන ක්‍රමය දන්නවා. හදන මිනිස්සු ඉන්නවා. අද ඒ හීනය ඇත්ත වෙලා!**

මම ඒ ගැන බොහෝම ආඩම්බරයි...! මගේ ආණ්ඩුව ගැනත්, මගේ ඇමතිවරු ගැනත්, මන්ත්‍රීවරු ගැනත්, නිලධාරි ගැනත්, අපේ මහජනයා ගැනත්, ඒ සියළුදෙනාගෙන් ම සිදුවන මෙහෙය ගැනත්, මම ආඩම්බර වෙනවා. මේ වැඩ සම්පූර්ණ උනහම මම ප්‍රාර්ථනා කරනවා, අපේ මහජනයාට සුඛිත මුදිතව සාමයෙන් සංවර්ධනයෙන් සැහීමට පත්වෙලා ජීවිත ගතකරන්නට පුළුවන් වේය කියා.

*ශ්‍රී ලංකා වාසීන්ට ජයවේවා!*

ප්‍රකාශනය—ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

REFERENCE